# පිහාටු මල



රජීන්ද සෙනරත් බණ්ඩාර ඒකනායක

# පිහාටු මල

**(හිස් අවකාශයේ පාවී ගිය මල් කැකුළ)**

**රජින්ද සෙනරත් බණ්ඩාර ඒකනායක**

# පිදුම

ඔබ දෙපා මත - තබා නළලත
පුදමි දෝතින් - මගේ මේ පොත

ධම්රදය තුළ
මට පිය සෙනෙහස දුන්
දයාබර පියවරුන් හට
සදා බැතියෙන්

ගරු විදුහල්පති කමල් ආරියසිංහ මැතිදුන්,
නියෝජ්‍ය විදුහල්පති දමිත නාරම්පනාව මැතිදුන්,
සහකාර විදුහල්පති කපිල ඒකනායක මැතිදුන්,

ජනිත සමරකෝන් මැතිදුන් ,
චන්දන පෙරේරා මැතිදුන්,
මනෝජ් කුමාර මැතිදුන්,
තරංග කුමාර මැතිදුන්,
මධුශංක රත්නායක මැතිදුන්,
සේනක දිසානායක මැතිදුන්,
රජිත දහනායක මැතිදුන්

සම්පත් අබේරත්න මැතිදුන්,
ජානක වංශනාත මැතිදුන්,
අසංක ආරියරත්න මැතිදුන්,
නිශාන්ත අතුකෝරල මැතිදුන්
දර්ශන බස්නායක මැතිදුන්,
චින්තක බණ්ඩාර මැතිදුන්,

ඔබේ එකම පැතුම
අපේ සුන්දර අනාගතයයි
ඒ පැතුම ඉටු කරන්නට
අනාගතයට පිය නගන්නෙමි


# මෙතෙක් ලිවූ පොත්




පුංචි සුපුන්
(2016)





සකි
(2017)





ගණිතය පාඩම
(2018)




අපි
(2019)




සිනහ නගයි කඳුළු
සලයි කොරෝනා
(2020)




නව යොවුන් විය
(2022)

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

# පටුන


පිහාටු මල

කතා කරන පොත්

සමු ගත් මුත්තා

නැවතියං මහ වැස්ස

සමිදු අභියස

දරු දුක උසුලන අම්මා මතු බුදු වන්නේ

දළදා හිමි ජේන දූරක

රෑ සදට කියුවක්

අමුතු හැඟුමක් සිතට ඇවිදින්

සැමදා දිවියේ (ගීතයක්)

අම්මාගේ පත් පිඟාන

අලුත් සපත්තුව

යාළු මාළු

වැනල් කරන වෛද්‍යවරු

නියගය

ඉරුණු කමිසය

මට හිතෙන්නේ (ගීතයක්)

අම්මා

තාත්තා

වාර විභාගය

පිනි බිඳුවක්

# පිහාටු මල

ගහක හෝ ලිය වැලක නොඉපද
නටුවකින් ගිලිහිලා නොවැටුණු
මලක් වූවද මලක් නොවෙනා
නුඹය මාගේ සිතෙහි රැඳී මල
ළමා විය සිට නුඹට පෙම් බැඳ
ලෙන්ගතුව නුඹය ළඟින් සිටියෙමි
නුඹෙන් ඉගෙනා ගත් බොහෝ දේ
ලොවට සතුටෙන් බෙදා දුන්නෙමි
නුඹ නිසා මම ජය ලබන විට
ලද ජයෙන් බුහුමන් ලබන විට
මගේ ජය නොපතනා ලෝකය
ඇත් කර දැමුවා මගෙන් ඔබ
නුඹේ දෙපසක පිල් බෙදිලා
දෙපස වුන් දෙදෙනෙකුගෙ පිත්තෙන්
ප්‍රහාරය තුළ සුළඟෙ පාවෙන
මගෙ අහිංසක මල් කැකුළ ඔබ
සිනිඳු සියුමැලි පිහාටුවකින්
සැදුණු සුන්දර මලේ නුඹහට
කියමි මේ ලෙස සොඳුරු ඔබෙ නම
නුඹය මාගේ "ෂැටල් කොක්" එක



# කතා කරන පොත්

Taking books

පොත් තරගෙට
මමත් ලිව්ව - කෙටිකතාව
මේ මුළු සිරි ලංකාවෙන්
පළමු තැනට - තේරුණහම
සිතට දැනුනු පුදුම සතුට
කියා නිමකරන්න බැරිව
මගෙ දෙනෙතට කඳුලු ඇවිත්
මුව ගොළු කෙරුවා - බොහෝම
ජීවිතයේ කවදාවත්
අත් නොවින්ද - මෙවන් මොහොත
බැහැර නොකර සිතට නැගෙන
හැඟුම් සිතට ගෙනෙයි සතුට



# <u>සමු ගත් මුත්තා</u>

***( 2018 වසරේ මගේ අයියා ලිවූ කවියකට ලිවූ පිළිතුරු කවියකි. )***

අයියත් මමත් යන විට - පාසල වෙතට
හැමදා දකිනවා ඔබෙරුව මග දෙපස
සුනඛ රැළක් සමගින් ඔබ යන ගමන
බැලූ විට සියුම් සතුටක් දැනුණා හිතට

හැමදා දකින මේ දසුනින් පිරුණු හිත
සමගින් දෙපා තබනෙමි පාසල වෙතට
එනමුදු මෑත දිනයක කණ වැකි පුවත
ඇසිලා හඬ වැටුනා හොඳටම මහිත

රෝගී වෙලා ඔබ ගෙන ගොස් රෝහලට
රෝගය දින ඇත පරදා ඔබෙ දිවිය
බලූ රැල බලා සිටියත් එනතුරු ඔබව
යන්නට ගිහින් ඔබ දෙව් ලෝකය වෙතට



# නැවතියං මහ වැස්ස

වහිනවා ... වහිනවා ... වහිනවා ....
හැමදාම
අනේ මට කියපං
එන්නෙ නුඹ කොහි සිටද
මේ තරම් ජල කඳක්
වළාකුළු හංගගෙන
එක පාර අත්හැරියෙ
හිතක් පපුවක් නැද්ද
නාය ගොස් කඳු පන්ති
ගෙවල් දොරවල් යටව
කොයි තරම් මිනිස්සුන්
පොළව තුල සැඟවුණිද
පදික වේදිකාවේ
මම කරන වෙළඳාම
මහා වැස්ස නිසාවෙන්
කිසිත් කරගනු බැරිය
තව තවත් ඇඳ හැලි
ගියොත් මේ මහ වැස්ස
දරු පැටව් හාමතේ
හඬන්නට වෙයි බොහොම

නුඹේ හපන්කම් ඉතිං
බලා සිටියා ඇතිය
අනේ දැන්වත් ඉතිං
නැවතියන් මහ වැස්ස



# සමිඳු අභියස


www.ColoringPages101.com

පාසලේ සිට - ගෙදර යන විට දී
අම්ම වැට ළඟ - මග බලා සිටියා
විභාගෙන් අඩු ලකුණු ගත් හංදා
ඇගෙ හදේ දුක - නෙතින් ඇද හැලුනා
කඳුළු පිස ඇය - සිනාසෙනු දැකලා
ඇයට වැඩියෙන් - මගේ හිත හැඬුවා
බැණ වැදී මට - පහර දුන්නා නම්
ටිකක් හරි හිත - හැදෙන්නට තිබුණා
දුක කියන්නට - කෙනෙක් නැති හින්දා
වාවගන්නට - බැරි දුකක් වින්දා
අනේ ! මම තව - වෙහෙස වූවා නම්
මට විභාගෙන් - ජයගන්න තිබුණා
එදා සමිඳුන් - මෙලොව සිටි හින්දා
සැනසුනා සෝපාකලා සැමදා
ඒත් අද මට - ඔබත් නැති හින්දා
ඔබව සිහිකර - හිත හදා ගත්තා

# දරු දුක උසුලන අම්මා මතු බුදු වන්නේ

පුංචි කුරුලු පවුලක් විලසට ගෙදර
සිටියා නිදහසින් අප සැම එකමුතුව
මතකයි කැඩී ගිය දින අප බැඳ යදම
අප්පච්චි ගියා දෙව් ලොව වෙත තනිව

එදා පටන් දිවියේ බර ගත් කරට
අම්මා මා නිසා දුක් වින්දා තනිව
එදා වේල සරිකර ගන්නට බැරිව
බැල මෙහෙවර කළා මගෙ බඩ පුරවන්න

උදේ පාන්දර තම්බා ඉදියප්ප
පාන්දරින් ගෙනිහින් කඩපිල් වෙතට
ආපසු විගස ඇවිදින් ගේ දොර වෙතට
පාසල වෙතට ගෙනිහින් ඇරළුව මාව



ගමේ ගෙවල් වල වැඩකරමින් දවස
ගෙවලා රෑට ගෙදරට විත් නිවසෙ වැඩ
කෙරුවා යන්ත්‍රයක් සේ සිනහා මුසුව
දුක් කරදර වසා හිනැහෙන්නේ කොහොම

මා අසලින්ම වැතිරී නිදියනා විට
නුඹෙ කෙදිරිලි ඇසේ දුක් බර ගී ලෙසට
මා හට ලොවක් තනන්ට ගන්නා වෙහෙස
දුටුවම නැගෙන දුක කිමට නැත වචන

විඳිනා දුකින් ගලවා ගන්නට නුඹව
මට කල හැක්කෙ ඉගෙනා ගන්නට හොඳට
රජෙක් වෙලා කෙදිනක හෝ මේ දියත
නුඹ රැජිනක් ලෙසට අභිසෙස් කරමි මම

# දළදා හිමි පේන දුරක

බෝගම්බර වැව් දිය රැළි
හරි හැඩයට පිහිනන විට
දිය කාවන් - තාරාවන්
නිල් දිය මත - සරණා විට
වැව් ඉවුරේ - මහ ගස් මත
වවුල් රැන් - නිදියන විට
සිහිල් සුළඟ - මට කිව්වා
රස රහසක් - හිමි හිමිහිට
වැව් ඉවුරේ - ඇවිදින විට
ඈත පෙනෙන - මාලිගාව
දෙස බලන්න - එක මොහොතක්
සිතට දැනෙනවා - සුවයක්
සුලග කිව්ව - ඒ වදනට
හිත යොමලා බලා සිටිය
වැවෙන් එහා මාලිගාව
දිහා මෙමා මුළු වරුවක්
ඇත්තයි ඒ කිව්ව රහස
මගේ සිතට දැනුන සුවය
කියන්න මට වදන් නොමැත
සුළග ඔබට පිං බොහොම

# රෑ සඳට කියුවක්

නිල් අහස පුරාවට
රෑ  අඳුර තුනී කර
මුළු ලොවම එළිය කර
ආඩම්බරෙන් බොහොම
තරු පොකුරු පිරිවරා
පුර සඳක් විලසකට
පායලා ආවම
නුඹ සිතුවෙ නුඹ තමයි
මේ දියත රැජින ලෙස
එහෙත් කිසි දිනෙක නුඹ
බිදක්වත් සිතුවාද
හිරු කුමරු නැති වුනොත්
නුඹෙ එළිය නොමැති බව
ඒ නිසා සඳවතියෙ
හිරු කුමරු වටා ගොස්
හිරුගෙ එළියෙන් නුඹගෙ
ලොව එළිය නොකරගෙන
නුඹම නුඹෙ ජීවිතය
ආලෝක කරගනින්

# <u>අමුතු හැඟුමක් සිතට ඇවිදින්</u>

<u>(ගීතයක්)</u>

අමුතු හැඟුමක් සිතට ඇවිදින්
සිත පුරාවට කරයි සක්මන්
සවන් යුග සිරවී කොහේදෝ
මියැසි ගී රාවයක ස්වරයක //

හැඟුම් පුබුදන ඇගේ කටහඬ
ලගින් නැවතී සදා කාලෙම
සිතම පිරුණත් ඇගේ වදනින්
ඔබව හැර යන්නට නොහැක මට

අමුතු හැඟුමක් සිතට ඇවිදින් .....

නිහඬ දෑසින් මදෙස බලලා
හඬන අම්මේ ඔබව අතර හැර
සිතට ලංවූ භාව, සිතිවිලි
ඉවතලමි මම ඔබයි මගෙ ලොව

අමුතු හැඟුමක් සිතට ඇවිදින් **.....**

# <u>සැමදා දිවියේ (ගීතයක්)</u>

සැමදා....... දිවියේ
ඔබ නෑ.......... සිටියේ
හැඩූවා........... රහසේ
ඔබ නෑ..........දුටුවේ //

නව යොවුන් විය ජීවිතය හා
වෙලි ගුලි වී සිටින විටදී
ජිවිතේ තුළ ඔබ නොමැති බව
දැනෙනවා වෙනදාට වැඩියෙන්

සැමදා....... දිවියේ //

තාත්තේ ඔබෙ සුරතෙ වෙලිලා
සෙනෙහසින් ඔබෙ ලොවේ ඉන්නට
වරම් නැති දා කිසිවෙකුත් නැත
මගේ තනිකම මකා ලන්නට

# අම්මාගේ බත් පිඟාන

එබුනහම අම්මාගේ බත් පිඟානට
සුදු බත් නොවේ හසුවුනේ දෙනෙතට
දුංතෙල් බත් ද **?** බුරියානි ද **?**
අනේ **!** නැහැ ඒ දංකුඩ

මාළු කැල්ලක් මගේ බත්පත මත
යොමු කලෙමි ඇගේ පිඟානට නෙත් යුග
මගේ ඇස් රැවටීමට ඈ
එළවලු සමග අනා ඇත බත් පත

කෝ මාළු යැයි විමසූ කළ
බත් සමඟ අනා ඇත කී විට
මාළුවෝ කියපන් නුඹවත් සත්‍යය
නුඹය නැහැ නේද ඇගේ බත්පත මත

සියලු රස එක් කොට
රාජ භෝජන විලසට
මගේ කුස පුරවනු මිස
වෙනත් සතුටක් නැතිය ඇය හට

# අලුත් සපත්තුව

ඇඟිලි පහම එළියටවිත්
සපත්තුවේ හිනැහෙන කොට
සපත්තු දෙක මට කිව්වා
මා හට සමු දෙනව කියා
අලුත් සපත්තුවක් ගන්න
මුදල් හොයාගන්න නැතිව
අම්මා තම්පලා වික්ක
මාසයක්ම ගම වටේට
හාරදහස් නව සීයට
සපත්තු යුගලක් අරගෙන
පැළඳ ගියා පාසැල වෙත
හරි හැඩයට පා තිය තිය
දිලිසි දිලිසි කළු පාටට
සුදු දිග කලිසමේ අගට
සපත්තු දෙක මට පෙනුනේ
දේව දූතයෙක් විලසට
උදෙන්ම පාසලට ගිහින්
බුදු මැදුර යන්න ගියා
සපත්තු දෙක ගලවාලා
බුදු මැදුරේ දොරටුව ළඟ
බුදුන් වැඳල ශ්‍රද්ධාවෙන්
එළියට විත් බැලුව විටදී
සපත්තු දෙක අතුරුදහන්
පරණ සපත්තුවක් තියල

අම්මා වික්ක තම්පල ටික
මතක් වෙලා හිත හඩද්දි
හිනාසුනා සපත්තු දෙක
වෙන කෙනෙකුගෙ කකුල් දෙකක



# යාළු මාළු

නුඹේ කුස තුළ - රැඳී ඉමි මම
එහෙත් නුඹෙ මගෙ - මව නොවේ
නුඹෙ කුසින් මේ - ලොව දකින්නට
පතන නුඹෙ පැටියෙක් නොවේ
මහා මුහුදේ - නෞකාව ලෙස
නම් දරා ඇති - නම නුඹේ
"තල්මසා" ලෙස - හඳුන්වයි නුඹ
මහා සිරුරැති - යාලුවේ
කුඩා මාළුන් - අහර ලෙස ගිල
දමා කුස පුරවයි - නුඹේ
ඒ ලෙසයි මම - නුඹේ කුස තුළ
රැඳී ඉන්නේ - මාළුවේ
ගිල දමන්නට - මොහොතකට පෙර
ටිකක් හිතපන් - මාළුවේ
පොඩි උනත් - ලොකු
උනත් අපි සැම
මාළුවෝ මගෙ යාළුවේ

# චැනල් කරන වෛද්‍යවරු

පෞද්ගලික රෝහල්වල
සැමවිට කියවෙන ඔබෙ නම
ජනප්‍රියයි ඔබ හොඳටම
වෛද්‍යවරයෙක් විලසට
උදේට මා නැඟිටින විට
නෙතට හසු නොවන ඔබ රුව
විමසිලීමත් වන විට නෙත්
අම්ම කිව්ව සැමවිට ඔබ
රෝහල් වෙත ගියා කියල
කිසිම දිනෙක මගෙ දිවියේ
දිවා කාලෙ නොදුටුව ඔබ
රාත්‍රියේ දැක ගන්නේ
මධ්‍යම රාත්‍රිය වන විට
ගෙල වට රැඳී වෙද නලාව
පපුවට තියලා බැලුවිට
හදේ ගැස්ම මිසක ඔබට
හිතක දුකක් තේරුනාද **?**
ඇසක කඳුලු දුටුවොත් ඔබ
ඇස් රෝගෙට බෙහෙත් දෙවි
හිතේ දුකට නෙත හඬ නා
වග තේරුම් නොගන්න ඇති
දිනපතාම මගෙ දිවියේ
මේ ලෙස ඔබ දකින විටදී
තාත්තෙ කිසි දිනෙක මෙමා
වෛද්‍යවරයෙක් නොවේවි.

# නියඟය

ගලා යන ගංගාවෙ හැඩය මිස
රිද්මයේ නැහැ කිසිදු සොඳුරු බව
වියළි ගිය ගහකොළ ද දුර්මුඛව
හිරු කුමරු දෙස බලයි අසරණව

ගොදුරු සොයමින් තැනින් නැත සරණ
පිළිහුඩුවො නුඹ මොකද අසරණව
පිපාසෙට ජල බිඳක්වත් නැතිව
කුසට අහරක් කෙසේ සොයන්නද **?**

වැහි නැතිව වේලිච්ච ගහ කොළද
කෙඩෑරිව ගිය සොඳුරු මල්වැල් ද
පී දෙන්න ලංව ඇති නිල් ගොයම
ඇයැදුවා පහස නිල්වන් දියක

# ඉරුණු කමිසය

සුදෝ සුදුවට - කොකෙක් වාගේ
ඇද පැළඳගෙන - ගියා පාසල්
දිනත් ගෙවුණා - සතිත් ගෙවුණා
මාස විසිහතරක්ම ගෙවුනා
සුදෝ සුදුවට - තිබුණු කමිසය
කහම කහ - පාටක් වෙලා
නූල් ගෙවිලා - ගියත් ඉරිලා
ඒත් තාමත් මාව පළඳින
පුංචි කොළුවෝ - කවදදෝ නුඹ
මාව නුඹගෙන් - වෙන් කරන්නේ
වෙනත් ඇඳුමක් - මිලට ගන්නට
මුදල් නැති හන්දා - මිසක නුඹ
මාව මේ ලෙස - ඇඳලා පැළඳල
තියාගත්තේ - ආදරෙට ද **?**
අනේ ! කොළුවො - හෙට අනිද්දම
මාව හොඳටම - ඉරිලා යාවි
ඊට කලියෙන් - නුඹට හැකි නම්
අලුත් ඇඳුමක් - ගනින් මිලදී

# <u>මට හිතෙන්නේ (ගීතයක්)</u>

මට හිතෙන්නෙ - මට තියෙන්නෙ
එක ආදරයයි
ඉල්ලුවාට - දෙන්නට බැහැ
එය හිමි ඇයටයි //

බැල්මෙන් කුල්මත් කලාට
හිනහව හද පිරෙව්වාට
හිත ආසයි සැමදා - ඔබෙ
ළඟින් සිටින්න
කොතරම් ඔබ ළඟ සිටියත්
අම්මයි මගෙ හිත තුළ ඉන්නේ

මට හිතෙන්නෙ - මට තියෙන්නෙ.........

ඔබෙ වදනින් සැනසුනාට
නිරතුරු මා ළඟ සිටිය ද
මගෙ හිත ළඟ - නවතින්නට
අවසර දෙනු බෑ
කිසිදා ඔබ වෙත - මගෙ පෙම
පුදකරන්න බෑ

මට හිතෙන්නෙ - මට තියෙන්නෙ..................

# අම්මා

තොරතෝංචියක් නැතිව
එක සිරුවට කෑ ගසන
ගෝරනාඩුව - ඇයයි
ජීවිතය ජීවත් කරවන - ජීවයට අරුත් සපයන
ජීවනාලිය - ඇයයි
මගේ ප්‍රාණය හිමි - ඇගේ ප්‍රාණය මම වූ
ප්‍රාණකරිය - ඇයයි
ලොවම බබළවන - ජීවිතයට ආලෝකයක් වූ
සුන්දර අම්මා - ඇයයි

# තාත්තා

අපිව මෙලොවට - බිහි කලේ නුඹ
ආදරෙන් බව - දනිමි මා
පුංචි පවුලක - සොඳුරු බව නිති
වින්ද ඔබ හා - අප සැමා
එහෙත් මත් - වතුරක රසයකට
සතුට දියකර - දැමූ නිසා
අපේ ලෝකෙන් - අම්ම සදහට
කියා අප සැම - හැර දමා
මවක් නොමැතිව - පියෙක් ළග ඇති
අනාවක අප - සිරවෙලා
ඔබට නොපෙනෙන - අපට පෙනෙනා
ලොවක් තුල අප - ගුලිවෙලා
තාත්තා යන - සොඳුරු නාමය
අසුන්දර වී සැඟවිලා
තාත්තේ ඔබ නිසා අප සැම
ජීවිතය තුළ තනිවෙලා

# වාර විභාගය

ගණන්වලට අනූපහයි - විද්‍යාවට හැත්තෑ අටයි
ලකුණු දැකලා මගෙ අම්මා - හරි සතුටින් සිනහ නගයි
ඉතිහාසෙට හැට හතරයි - මුළු සතුටම සේදී යයි
සතුටෙන් සිටි මගෙ අම්මා - බුම්මාගෙන බලා හිඳියි
බුද්ධාගම ප්‍රශ්නයකට - ගාථාවක් නොලිව් නිසා
ලකුණු හතරකුත් කපලා - ඒකට මට පනස් පහයි
කතා නැතිව මගෙ අම්මා - දැඩි දුකකින් කඳු සලයි
තවත් විෂයයන් තිබුණත් - තාම ලකුණු නොදන්න මුත්
අනේ දෙවියනේ ! ඒවට - හොඳ ලකුණක් මට ලැබියන්
නැතිනම් ඒ ලකුණුවලත් - තව අඩු ලකුණක් තිබුණොත්
අධික රුධිර පීඩනයෙන් - අම්මා හොඳටම ලෙඩ වෙයි

# පිනි බිඳුවක්

නුඹ ආවම මං ගාවට
මම මිය ඇදෙනව එක විට
මාත් එක්ක ඔය තරමට
තරහා ඇයි ද හිරු කුමරෝ



නුඹ අහසේ පායන විට
දිලිසි දිලිසි පොලොවෙ ඉඳන්
නුඹ දිහාම බලන් ඉන්න
මට පින් නැහැ හිරු කුමරෝ

හැමදාමත් නුඹ දකින්න
ආසාවෙන් මම හිටියට
නුඹෙයි මගෙයි හමුවීමක්
කිසි දින නැහැ හිරු කුමරෝ



කාලය වේගයෙන් ඉගිලේ. ඒ ගෙවී යන කාලයක් සමග කළ යුතු දේ බොහෝය. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය ආසන්නය. බලාපොරොත්තුව A9 කි. පාඩම් වැඩ හොඳින් කරගෙන යන අතරතුරේදී ලැබෙන සුළු විවේකයේදී කවියක් හෝ කෙටි කතාවක් පබැඳුවෙමි. "පිහාටු මල" හා "විසල් ලොවක මම" බිහිවුනේ එලෙසිනි. මගේ කවියත් හෝ කතාවක් නිර්මාණයක් ලෙස බිහිවන විට එය අගය කළ, එයට උදවු කළ අය බොහෝය.

ඒ අතුරින් දෙරණ මාධ්‍ය ජාලයට මගේ හෘදයාංගම ස්තූතිය පළ කර සිටින අතර ගරු විදුහල්පති කමල් ආරියසිංහ මැතිතුමාවද, දමිත නාරම්පනාව මැතිතුමා ඇතුළු සියලු නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට ද, කපිල ඒකනායක මයා හා සමන්ති සිරිවර්ධන මිය ඇතුළු සියලු සහකාර විදුහල්පතිවරුන්ට ද, සම්පත් සර්, චන්දන සර්, මනෝජ් සර්, වංශනාත සර්, අසංක සර්, යසස්නි මැඩම්, චාන්දනී මැඩම්, අචිනි මැඩම්, නයෝමිනි මැඩම්, නාමලී මැඩම්, අනුරාධී මැඩම් ආදරයෙන් සිහි කරමි. එමෙන්ම මාලා මැඩම්, චම්පා මැඩම්, ඇනීටා මැඩම්, ධම්මික සර්, හර්ෂ සර් ආදරයෙන් සිහි කරමි.

අපේ පවුලේ සියලු දෙනවද ආදරයෙන් සිහි කරමි. මෙම පොත කියවා ඔබේ අදහස් මා වෙත දන්වන මෙන් ආදරයෙන් ඉල්ලමි.


0760856846
0774179967

රජීන්ද සෙනරත් බණ්ඩාර ඒකනායක
58/7A, පාරමී කුලතුංග මාවත,
ලේවැල්ල, මහනුවර.